# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,874/7 — 1969 ඔක්තෝබර් 7 වැනි අඟහරුවාද — 1969.10.7

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

## පළාත් පාලන නිවේදන

### පළාත් පාලනය පිළිබඳ පරීක්ෂණ කමිටුව

(i) පළාත් පාලන ආයතනවල වර්තමාන ආදායම් මාර්ගවල ප්‍රමාණවත් බව, රජයත් පළාත් පාලන ආයතනයත් අතර පවතින මුදල් සම්බන්ධතාව, පළාත් පාලන ආයතනවල කාර්යයන් මීට වඩා කාර්යක්ෂම අන්දමින් කිරීමට ඉඩ සැලසෙන පරිදි එම ආයතනවලට ලබා දිය යුතු නව ආදායම් මාර්ග කවරේද යන්න,

(ii) පළාත් පාලන ආයතන මීට වඩා කාර්යක්ෂම අන්දමින් ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් පාලන ආයතනවල නගරාධිපතිවරුන්/සභාපතිවරුන් තෝරා පත් කිරීමේ වර්තමාන ක්‍රමයෙහි සහ නගරාධිපතිවරුන්ගේ/සභාපතිවරුන්ගේ බලතල සහ කාර්යවල සහ පළාත් පාලන ආයතන සමඟ ඔවුන්ගේ සම්බන්ධතාවයන්හි කිසියම් වෙනසක් කළ යුතු ද යන්න,

(iii) කාරක සභාව වෙත යොමු කෙරෙන කිසියම් වෙනත් කරුණු,

පිළිබඳව පරීක්ෂා කර බලා නිර්දේශයක් කිරීම සඳහා පහත නම් සඳහන් අයගෙන් සමන්විත කාරක සභාවක් පළාත් පාලන ගරු ඇමතිතුමා විසින් සතුටින් පත් කොට ඇත. ඒ අය නම් :—

(1) වී. සී. ජයසූරිය මහතා (සභාපති),
(2) ඩී. එස්. ද සිල්වා මහතා,
(3) ආචාර්ය සී. එෆ්. අමරසිංහ මහතා.

මෙම පරීක්ෂණයට අදාළ කරුණු පිළිබඳව නියෝජනයන් ඉදිරිපත් කරන ලෙස පළාත් පාලන ආයතනවලට, පළාත් පාලන ආයතන පිළිබඳ සංගම්වලට, පළාත් පාලන ආයතනවල සේවකයින්ට, බදු ගෙවන්නන්ගේ සමිතිවලට හා මේ ගැන උනන්දුවක් දක්වන අනිකුත් පුද්ගලයින්ට හෝ සංවිධානවලට මෙම කමිටුව ආරාධනා කරයි.

ඉදිරිපත් කරනු ලබන නියෝජනයන් පිටපත් සතරකින් යුතුව මෙම දැන්වීම ප්‍රසිද්ධ වූ දින සිට සති දෙකක් ඇතුළත මා වෙත එවුවහොත් මැනවි. අවශ්‍යයයි හැඟේ නම් නියෝජනයන්හි ඇතුලත් කරුණු පිළිබඳව කමිටුව සමඟ වැඩිදුරටත් සාකච්ඡා කරනු සඳහා කලින් නියම කරනු ලබන දිනකදී පැමිණීමට කමිටුව අවස්ථාව සලසනු ඇත. මෙම කමිටුවේ කාර්යාලය කොළඹ 4, බම්බලපිටිය රිය මහ, අංක 8 දරණ ස්ථානයේ (ගෙවල් කුලී සමාලෝචන මණ්ඩලය) පිහිටා ඇත.

එම්. එල්. එම්. පෙරේරා,
ලේකම්.

අංක 8,
බම්බලපිටිය රිය මහ,
කොළඹ 4.

10–606


ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි.

1A—ජේ 6919—7,225 (10/69)